**සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම - 2015**

**-----------------------------------------------------------**

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ ("සමාගම") 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 සමාගම පිහිටුවීම හා අයිතිය

**-----------------------------------**

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සීමිත වගකීම් සමාගමක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කර ඇත. මෙය සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන අතර භාණ්ඩාගාරයේ ලේකම් සමාගමේ තනි කොටස් හිමිකරු වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**-----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමූවාප්‍ර)**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 - වාර්තා කරන කාල පරිච්ඡේදයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරනු ලැබූ දිනය හෙළිදරව් කළ යුතු වුවද සමාගම එයට අනුකූල වී නොතිබුණි.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

සමාගමේ සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ ගනුදෙනු පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්

ප්‍රමිතිය ප්‍රකාරව, ආයතනය සම්බන්ධව ඇති නඩුවල වර්තමාන තත්ත්වය සලකා බලා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පවතින අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත් සමාගම එයට අනුකූලවී නොතිබුණි. තවද, පවත්නා නඩු පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා නීතිඥවරුන්ගේ සනාථන ලිපි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39 - මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මැනීම කිරීම

ප්‍රමිත 09 (ii) , 46 (අ) හා (ආ) ඡේද ප්‍රකාරව, සේවක ණය සහ අනෙකුත් ණයගැති ශේෂ සඵල පොලී අනුපාතය ක්‍රමය යටතේ ගලපා ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. තවද, කල් පිරෙන තෙක් තබා ගනු ලබන ස්ථාවර වත්කම් කල් පිරෙන තෙක් තබා ගැනීමට අදහස් කරන "ආයෝජන" යටතේ වර්ගීකරණය කල යුතු අතර සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කර මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතුය. කෙසේ වෙතත් සමාගම එයට අනුකූල වී නොතිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශනවල ජංගම

වත්කම් යටතේ දක්වා ඇති රු. 910,838,300 ක් වටිනා තැන්පතු ප්‍රමිතියේ 9 හා 45 ඡේද ප්‍රකාරව වර්ගීකරණය සහ මිනුම්කරණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 41 - කෘෂිකර්මය
---------------------------------
ජීව විද්‍යාත්මක පරිවර්තනයන් හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව දැක්විය යුතු වුවද සමාගම විසින් රු. 624,198,372 ක් වටිනා ජීව විද්‍යාත්මක වත්කම්, ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ විස්තර හෙළිදරව් කර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. ප්‍රමිතියට අනුව ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයට ගණනය කර ගිණුම්වල හඳුනාගත යුතු වුවද උක්වගාව සඳහා දරන ලද තථ්‍ය වියදම ගණනය කර එහි වටිනාකම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) ශ්‍රීලංමූවාප්‍ර 07- මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම
-----------------------------------------------------
හානිකරණය සඳහා ප්‍රතිපාදන, සැසඳීමක් ලෙස වෙනම ඉදිරිපත් කළ යුතු වුවද, සමාගම විසින් අඩමාණ ණය සෘජුවම වත්කම් වලින් අඩුකර ගොවීන්ගෙන් අයවිය යුතු ණය යටතේ දක්වා තිබුණි.

(උ) ශ්‍රීලංමූවාප්‍ර 08 - මෙහෙයුම් අංශ
--------------------------------------
ප්‍රමිතයේ 22 සහ 28 ඡේද ප්‍රකාරව වාර්තාකරණ අංශයන්ට අදාළ සිදුකළ යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමට අයත් සෙවනගල සීනි කර්මාන්තායතනයෙහි ස්ථාවර වත්කම් ලේඛනය තුළ රු. 14,170 ක සෘණ අගයක් ගත් වත්කමක් පැවතුණි.

(ආ) සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබූ ඉඩම් සංවර්ධන සඳහා සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය වාර්ෂිකව සියයට දෙකක් බැගින් ක්ෂය කිරීම වුවද, මහවැව ව්‍යාපෘතියේ රු.8,384,151 ක් වටිනා ඉඩම් සංවර්ධනයන් සඳහා වාර්ෂිකව සියයට හතර බැගින් ක්ෂය කර ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළව ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති රු. 760,763,929 ක ශේෂය ඒවා මිලට ගත් දිනයන් නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය ගලපා තිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ කල්බදු ගිවිසුම් 08 කට අදාළව රු. 19,038,439 ක් වූ ගෙවිය යුතු පොලී වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) යල් පැන තිබූ තොග සඳහා වෙන්කිරීම් හඳුනාගැනීමට ඉන්වෙන්ට්‍රි විෂයයන් සඳහා කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණු අතර සමාගමේ සෙවනගල සීනි කර්මාන්තායතනයට අයත් ඉන්වෙන්ට්‍රි විෂයයන් අයිතම පහක රු. 36,435,394 ක සෘණ වටිනාකමක් තිබුණි.

(ඊ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශනවල "තක්සේරු ගැලපීම්" ලෙස රු.1,847,711 ක් අඩු කර රු. 4,813,390 ක් එකතු කර විකුණුම් පිරිවැය ගණනය කර තිබුණි. එම නිසා නිවැරදි පිරිවැය ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය නොකර ගණනය කර ඇති පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මුළු විකුණුම් පිරිවැය වූ රු. 3,710,632,390 ක නිවැරදිතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(උ) පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතනයන්හි ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති වත්කම් වලින් පෙර පැවති කළමනාකරණයට අයත් වත්කම් හඳුනාගැනීමට නොහැකි වූ අතර එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැති බැවින් එම වත්කම්වල සාධාරණ අගය නොදැක්වුණි.

(ඌ) ආදායම් බදු හා විලම්බිත බදු ගණනය කිරීම 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව සිදුකර නොතිබුණි.

### 2.2.3 හඳුනා නොගත් වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමට අයත් සෙවනගල සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පිරියත හා යන්ත්‍රෝපකරණ ශුද්ධ ශේෂය රු. 440,242,580 ක් වුවද, උපලේඛන අනුව එය රු. 430,194,601 ක් වූයෙන් රු. 10,047,979 ක වෙනසක් තිබුණි.

(ආ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි ස්ථාවර වත්කම් ලේඛනයෙහි දැක්වෙන පිරිවැය ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ ක්ෂේත්‍ර පිරියත උපකරණ සහ වාහන පිරිවැය පිළිවෙලින් රු. 442,730 ක හා රු. 442,924 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලය විසින් ගෙන තිබූ පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතනයන්ට අදාළ ශේෂයන්, විගණනය සඳහා එම කර්මාන්තායතනයන් විසින් ඉදිරිපත් කල ගිණුම්වල සඳහන් ශේෂයන් අතර වෙනස්කම් පැවතුණි. ඒ අනුව පැල්වත්ත සීනිකර්මාන්තායතනයේ ගිණුම් ශේෂයන් 4 කට අදාළව රු.67,560,469 ක වෙනසක් සහ සෙවනගල සීනි කර්මාන්තායතනයේ ගිණුම් ශේෂයන් 5 කට අදාළව රු. 26,435,833 ක වෙනසක් පැවතුණි.

(ඈ) සෙවනගල හා පැල්වත්ත සීනි කර්මාන්තායතනවල මූල්‍ය ප්‍රකාශන අනුව, සෙවනගල සීනි කර්මාන්තායතනයට ගෙවිය යුතු ශේෂයේ රු.1,084,930 ක වෙනසක්ද, ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතු ශේෂයේ රු. 2,000,390 ක වෙනසක්ද පැවතුණි. ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන අනුව, ප්‍රධාන කාර්යාලයෙන් ලැබිය යුතු ශේෂයේ රු. 45,596,272 ක වෙනසක්ද පැවතුණි.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 2.2.4.1 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගොවීන්ගෙන් අයකර ගත යුතු වූ 1987 සිට ගිණුම්වල පැවත එන රු. 592,930,256 ක් වූ ලැබිය යුතු දිගුකාලීන හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ තුළ 2012 වර්ෂයේ සිට පැවත එන

සේවක සමාජ ශාලාවෙන් ලැබිය යුතු රු. 1,578,177 ක හිඟ ශේෂයන්ද පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය වූ 2012 වර්ෂයේ සිට පැවත එන අත්තිකාරම් හා පෙර ගෙවුම් ශේෂ තුළ දක්වා තිබූ රු. 2,564,708 ක ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අත්තිකාරම් හා පෙර ගෙවුම් ශේෂ තුළ 2013/2014 වර්ෂ වලදී සැපයුම්කරුවන්ට ලබාදෙන ලද රු.1,348,314 ක ශේෂ ඇතුළත් වී තිබූ අතර එම ශේෂ අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඇ) කාල විශ්ලේෂණයක් මඟින් බොල් හා අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණු අතර සෙවනගල සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගොවීන්ගෙන් අයකරගත යුතු රු. 319,114,107 ක ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ණයගැති ගිණුම් වටිනාකම තුළ රු. 50,225 ක බැර ශේෂ ද ඇතුළත්ව තිබුණි.

(ඉ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අත්තිකාරම් හා පෙර ගෙවුම් ශේෂය තුළ 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 26,304,842 ක මාර්ගස්ථ තොග ඇතුළත් කර තිබූ අතර එම ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඊ) රජයට පවරාගැනීමට පෙර පැවති කළමනාකරණය විසින් ගොවීන් වෙත ලබා දී තිබූ ණය පහසුකම් පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගිණුම් ගත කර තිබුණු නමුත් සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් එය හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

### 2.2.4.2 ගෙවිය යුතු ගිණුම්

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි ණයහිමි පාලන ගිණුම තුළ 2011 වර්ෂයේ සිට ණයහිමි ශේෂ රු. 67,403,708 ක් ඇතුළත්ව තිබූ අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව වසරකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත වියදම් ගිණුමක් ලෙස රු.3,972,068 ක ශේෂ පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගිණුම් තුළ ඇතුළත් කර තිබුණි.

(ඇ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ තුළ 2011 වර්ෂයේ සිට ගෙවිය යුතු රු. 13,658,977 ක සේවක අර්ථසාධක අරමුදල් අධිභාරයක් ඇතුළත්ව තිබූ අතර ගෙවිය යුතු සේවක දිරිදීමනා හා ගොවීන් වෙත ගෙවිය යුතු දිරිදීමනා පිළිවෙලින් රු. 56,999 ක් හා රු.2,225,407 ක ශේෂ එම ශේෂය තුළ ඇතුළත්ව තිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ලංකා සතොස වෙත ගෙවිය යුතු රු. 8,086,000 ක ශේෂයක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) හිමිකම් නොපෑ චේතන නිරවුල් කිරීමේදී අක්‍රමිකතා සිදුවිය හැකි බැවින් කෙටිකාලීන ක්‍රියාමාර්ග ගත යුතු වුවත් එකතුව රු. 4,074,921 ක් වූ එම ශේෂ වසරකට වඩා වැඩි කාලයක් පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ගිණුම්වල පැවතුණි.

(ඊ) සෙවනගල සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණයහිමියෝ යටතේ වසරකට වඩා වැඩි කාලයක් දක්වා තිබූ රු. 152,132 ක ශේෂ නිරවුල් කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(උ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළ රු. 160,442,120 ක් වූ ජාතිය ගොඩ නැගීමේ බදු (NBT) ශේෂය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමෙන් තොරව විවිධ ණයහිමියන් තුළ ඇතුළත් කර තිබුණි.

(ඌ) ගොවීන්ගෙන් ලද රු. 59,822,499 ක පැරණි බැර ශේෂ සෙවනගල සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණය හිමියන් වශයෙන් සාවද්‍යව දක්වා තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් විෂයයන් වලට අදාළව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| හෝටල් ව්‍යාපෘති ශේෂය - පැල්වත්ත සීනි කර්මාන්තායතනය | 74,821,594 | වටිනාකම තහවුරු කර ගැනීමට අදාළ උපයෝගී ලියවිලි |
| අපහරණය කළ ක්ෂේත්‍ර පිරියත හා උපකරණ(Field plant and equipment) - පැල්වත්ත සීනි කර්මාන්තායතනය | 210,000 | |
| ප්‍රවර්තන වර්ෂයේ ගැලපුම් | 4,170,957 | |
| බැංකුව වෙත ගෙවිය යුතු කල්බදු | 11,812,500 | බැංකු සනාථන ලිපි |

(ආ) 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත ප්‍රකාරව සමාගමට පවරගන්නා ලද වත්කම් පිළිබඳ ලැයිස්තුවක් සමාගම සතුව නොතිබුණි.

### 2.2.6 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| I. 9.2 (ඇ) ඡේදය | සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත්, සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ඊට අයත් පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තායතනයන් එයට අනුකූල වී නොතිබුණි. |
| II. 5.2.5 ඡේදය | ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන අයවැය ලේඛනයේ පිටපතක් අදාළ වර්ෂය ආරම්භ වී දින 15 ක් ගත වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2016 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික අයවැය ලේඛනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| III. 6.5.1 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් එහි ගිණුම් ඉදිරිපත් කර තිබුණේ ගිණුම් වර්ෂය අවසන් වී මාස 5 ක් සහ දින 20 ක ප්‍රමාදයකින් පසුවය. |
| (ආ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 හා 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | I. පෞද්ගලික ගමන් සඳහා නිල වාහන පාවිච්චි කිරීමට හිමිකම් ඇති නිලධාරින්ට රු. 30,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් හා අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාවක් පමණක් ගෙවිය හැකිය. කෙසේවෙතත්, එම චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද නොමැතිව ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකුට 2015 වර්ෂය සඳහා රු. 240,000 ක්ද, පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිලධාරීන් 8 දෙනෙකුට රු. 838,000 ක මුදලක් ද වැඩිපුර ගෙවා තිබුණි.<br><br>II. ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලබන නිලධාරීන්, රියදුරෙක් හෝ රියදුරු දීමනාවක් සඳහා හිමිකම් නොලබන නමුත්, පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) විසින් ආයතනයේ ස්ථිර සේවයේ නියුතු රියදුරෙකු තම වාහනයේ රියැදුරු ලෙස සේවයේ යොදවා ගෙන ඇති අතර ඔහු වෙනුවෙන් 2015 වර්ෂයේදී සමාගම ගෙවා ඇති මුළු වැටුප රු. 488,542 ක් විය. තවද කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ට වෙන්කර තිබූ යාලබෝව නිවාස සංකීර්ණයේ නිවසක් එම රියදුරුට ලබා දී තිබුණි. |
| (ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | ජාතික පාරිසරික පනත ප්‍රකාරව, සෙවනගල සීනි කර්මාන්තායතනය සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |

(ඇ) 2006 ප්‍රසම්පාදන
මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 2.14.1 සහ 3.2.1 මාර්ගෝපදේශය | පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් රු. 128,910,000 ක් වටිනා දොඹකර යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීමේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර ජාතික තරඟකාරී ලංසු කැඳවීම් වෙනුවට වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි. |
| 3.2.1 මාර්ගෝපදේශය | සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් රු. 17,400,000 ක් පිරිවැය වූ දොඹකර යන්ත්‍රයක් මිලදීගැනීමේදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| 3.4.1. (අ) සහ 7.12.2 (අ) මාර්ගෝපදේශය | වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කළ යුත්තේ වටිනාකම අඩු හා වහාම ලබාගත යුතු හදිසි භාණ්ඩ සඳහා වුවත් සෙවනගල කර්මාන්තායතනය විසින් " ෂාප්ට් මවුන්ට් ගියර් බොක්ස්" (Shaft Mount Gear Box) දෙකක් රු. 11,872,000කට මිලදී ගැනීමේදී වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබූ අතර ලංසු කැඳවීම් සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දී නොතිබුණි. |

**2.2.7 බලය නොලත් ගනුදෙනු**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිගේ අනුමැතිය මත පමණක් පදනම්ව සෙවනගල සීනි කර්මාන්තායතනයේ, සමාගමේ ප්‍රධාන කාර්යාලයේ හා පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ඉහළ කළමනාකරණය විසින් පිළිවෙලින් රු. 1,920,000 ක් , රු. 1,560,000 හා රු. 22,537,806 ක් විවිධ දීමනා වශයෙන් ලබාගෙන තිබුණි.

(ආ) 2015 අගෝස්තු 24 දින තීරණය කරන ලද මිලට වඩා අඩු මිලගණන් යටතේ එතනෝල් අලෙවි කිරීම නිසා පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙන් රු. 31,218,000 ක් හා සෙවනගල සීනි කර්මාන්තායතනයෙන් රු. 15,000,000 ක් ලෙස සිදු වී ඇති මුළු අලාභය රු. 46,218,000 ක් විය. එසේම එතනෝල් සඳහා නිශ්චිත අලෙවි මිලක් තීරණය කර නොතිබුණු අතර එම කාලය තුළ එක් එක් ආයතනවලට විවිධ මිල ගණන් යටතේ එතනෝල් අලෙවි කර තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය විසින් වියදම් කිරීමට නිසි අධිකාර බලයක් ලබා නොගෙන රු. 4,002,360 ක් හා රු. 6,665,725ක් පිළිවෙලින් බදුල්ල සහ කන්තලේ ව්‍යාපෘති වියදම් දැරීමට සෙවනගල සීනි කර්මාන්තායතනයෙන් ලබා ගෙන තිබුණි.

(ඈ) 2014 වර්ෂයේදී සෙවනගල සීනි කර්මාන්තායතනය වෙතින් රු. 26,462,500 ක මුදලක් ලබාගෙන සමාගමේ ප්‍රධාන කාර්යාලය විසින් පෞද්ගලික බැංකුවක ස්ථිර තැන්පතුවක් ආරම්භ කර තිබුණි. කල් පිරීමට ප්‍රථම එම තැන්පතුව 2016 මාර්තු 13 දින ආපසු ලබා ගැනීම නිසා රු. 870,000 ක පොලියක් අහිමි වී තිබුණි.

(ඉ) සෙවනගල සීනි කර්මාන්තායතනයෙන් ප්‍රධාන කාර්යාල ගිණුමට මාරු කර තිබූ රු.10,600,000 ක මුදලින් රු. 10,048,000 ක් පිරිවැය වූ වාහනයක් ප්‍රධාන විධායක නිලධාරී වෙනුවෙන් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වුවද එම මුදල මාරු කිරීමට හෝ වාහනය ප්‍රසම්පාදනය කිරීමට අනුමැතියක් ලබා දී නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 1,052,439,824 ක බදු පෙර ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු. 211,012,935 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 841,426,889 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 657,667,601 කින් අඩුවීම, සහ විකුණුම් පිරිවැය රු. 160,665,253 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 සමාගමේ අගය එකතු කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ පාඩුව රු. මිලියන 1,067.3 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළ රට වෙනුවෙන් සමාගමේ දායකත්වය රු. මිලියන 1,305.6 ක් විය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුනක කාලපරිච්ඡේදය තුළ රට වෙනුවෙන් සමාගමේ දායකත්වය පහත පරිදි වේ.

| විස්තරය | 2015 | 2014 | 2013 | 2012 (අවසාන මාස 03) |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වර්ෂය සඳහා ලාභය (පාඩුව) | (1,067,300,530) | (150,836,960) | 816,828,301 | (174,323,817) |
| එකතුකළා- සේවක පාරිශ්‍රමික | 2,092,819,358 | 1,658,235,775 | 1,540,551,175 | 1,414,038,931 |
| රජයට ගෙවූ බදු | (14,860,706) | 60,175,975 | | |
| ක්ෂය වීම් | 294,951,968 | 268,727,657 | 199,837,040 | 46,752,626 |
| **අගය එකතු කිරීම** | **1,305,610,090** | **1,836,302,447** | **2,557,216,516** | **1,286,467,740** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාගමේ මුළු සේවක පාරිශ්‍රමික රු. 434,583,583 කින් වැඩි වී තිබුණි.

### 3.3 වැදගත් ගිණුම්කරණ අනුපාත

---------------------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| විස්තරය | සමාලෝචිත වර්ෂය | පෙර වර්ෂය |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.8 | 1 : 2.25 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1 : 1.7 | 1 : 1.55 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාගම රු. මිලියන 910.84 ක් හා රු. මිලියන 1,733.87ක් පිළිවෙලින් 2015 වර්ෂය හා 2014 වර්ෂය අවසානයට ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර තිබුණු අතර මෙම ආයෝජන සමාගමේ ජංගම වත්කම් වල ඇතුළත් කර තිබුණි. ඒ හේතුවෙන් සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සතුටුදායක මට්ටමක පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 11,872,000 ක වටිනාකමින් යුත් ෂාප්ට් මවුන්ට් ගියර් බොක්ස් (Shaft Mounted Gear Box) දෙකක් උක් ඇඹරීම සඳහා හදිසි අවශ්‍යතා ලෙස සලකා ප්‍රසම්පාදනය කර තිබූ අතර එය 2014 මැයි මස 24 දින ප්‍රධාන ගබඩාවට ලැබී තිබුණි. කෙසේ වුවද මෙය නිෂ්පාදනාගාරයේ සවිකර තිබුණේ 2015 දෙසැම්බර් මාසයේ දීය. තවද 2016 උක් ඇඹරීම ආරම්භ කළ පළමු දිනයේදීම මෙම යන්ත්‍රය ක්‍රියාවිරහිත වී තිබුණි.

(ආ) උක් දඬු බෑමේ පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම

--------------------------------------------------

I. පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් රු. 128,910,000 ක වටිනාකමකින් යුතු දොඹකරයක් (Cane Unloading System) මිලට ගෙන තිබුණු අතර එය නිවැරදිව සවිකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 61,333,644 ක් වැය කර කර්මාන්තායතනයේ පැවති පැරණි දොඹකරය සවිකර තිබුණි.

II. සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් රු. 17,400,000 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර තිබූ උක් බෑමේ පද්ධති දෙකක් 2015 ජුනි 25 වන විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. කෙසේවෙතත්, විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව රු. 1,809,600 ක් වූ අවසන් ගෙවීම 2015 නොවැම්බර් 27 දින සමාගම විසින් සිදු කර තිබුණි.

(ඇ) සමාගමට අයත් සෙවනගල සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදිත එතනෝල් ගැනුම්කරුවන් වෙත නිකුත් කිරීමේදී එම ප්‍රමාණයන් මැන බැලීම සඳහා රු. 1,951,019 ක වටිනාකමකට මද්‍යසාර මැනීමේ යන්ත්‍රයක් ( ALCOHOL Flow Meter - Neptune) 2013 වර්ෂයේදී ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේවෙතත් මෙම යන්ත්‍රය මගින් නිවැරදි මිණුම් දත්ත ලබාදී නොතිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් වාහන සහ පිරියත හා උපකරණ එකසිය විසි එකක් එම කර්මාන්තායතනයට අයත් කෘෂිකාර්මික වැඩපල වෙත අළුත්වැඩියා සඳහා යොමුකර තිබුණි. කෙසේවෙතත් එම වාහන හා යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට ප්‍රමාද වීම මත නිෂ්කාර්යව පැවතුණි. තවද, සමාගම විසින් එම වාහන හා යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් මාසයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා අලුත්වැඩියා සඳහා භාරදුන් ට්‍රැක්ටර් 13 ක්, රොබින් පොම්ප 3ක්, ලොරියක් සහ නිසාන් කැබ් රථයක් අළුත්වැඩියා සිදු කිරීමෙන් තොරව තබා තිබුණි.

(ඊ) සෙවනගල සීනි කර්මාන්තය අපජලය පිරිපහදු යන්ත්‍රයක් ඉදිකිරීම සඳහා රු.27,067,812 ක කොන්ත්‍රාත්තුවක් 2014 මැයි මාසයේදී ප්‍රදානය කර තිබුණද 2016 අගෝස්තු 31 වන විටද එය

නිමකර නොතිබුණි. එමනිසා කර්මාන්තශාලාව සඳහා ලබාගත යුතු පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ද ලබාගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.

(උ) 2015 වර්ෂය තුළ සිදුවී ඇති රිය අනතුරු 21 ක් පිළිබඳ තොරතුරු විගණනය වෙත ලැබුණු අතර ඉන් අනතුරු 15 කට අදාළ ඇස්තමේන්තුගත පාඩු සඳහා බිල්පත් ඉදිරිපත් කිරීම මගින් රක්ෂණ සමාගමෙන් රක්ෂණ හිමිකම් ඉල්ලා නොතිබුණි. තවද අලුත්වැඩියා කිරීම සඳහා කෘෂිකාර්මික වැඩ වලට යවා ඇති වාහන අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට ප්‍රමාද වීම හේතුවෙන් අලුත්වැඩියා කිරීමෙන් තොරව ඒවා ධාවනයේ යොදවා තිබුණි.

(ඌ) කළමනාකරුවන්ගේ නිවාස සංකීර්ණයේ නිවාස 04 ක් හා නගර සංවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ පවතින නිවාස 131 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතියද එය පිළිසකර කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. මෙයින් නිවාස 12 ක් වසර 10 කටත් වැඩි කාලයක් අළුත්වැඩියා කර නොතිබුණි.

(එ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිලධාරීන් 07 දෙනෙකුගෙන් සහ ලංකා බැංකුව පැල්වත්ත ශාඛාවෙන් කුලී අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඒ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් ට්‍රේලර්, බවුසර්, ක්‍රේන්, ලෝඩර්, එක්ස්කැවේටර් 132 ක් සමාගම විසින් ලියාපදිංචි කර නොතිබුණි.

(ඔ) සෙවනගල සීනි කර්මාන්තායතනයට උක් වගා කිරීම සඳහා වෙන්කර දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 4198.41 කි. කෙසේවෙතත්, එයින් ඉඩම් හෙක්ටයාර් 281.51 ක වෙනත් බෝග වගා කර ඇති අතර තවත් හෙක්ටයාර් 27.55 ක් අනවසර ඉදිකිරීම් සඳහා යොදාගෙන තිබුණි.

(ඕ) 99 අවුරුදු බදු පදනම යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සමාගම වෙත හෙක්ටයාර් 469.87 ක ඉඩම් ප්‍රමාණයක් පවරා දී තිබුණද සමාගම සතුව බදු ගිවිසුම් නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ඉඩම්වල අනවසර පදිංචිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.

(ක) සෙවනගල සීනි කර්මාන්තායතනය සතුව නිල නිවාස 57 ක අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටින අතර තවත් නිවාස 26 ක් අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් පදිංචියට සුදුසු තත්ත්වයේ නොපවතී. මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කලමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ග) සමාගමේ ඉන්ධන බවුසරයක් අනතුරක් හේතුවෙන් අලාභහානි වී තිබුණි. කෙසේවෙතත්, ආදායම් බලපත්‍ර සහ රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබීම නිසා රු. 906,972 ක අලාභය සමාගමට දැරීමට සිදුවී තිබුණි.

(ජ) සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් අවස්ථා 04 කදී රු. 2,218,134 ක මුදලක් වැටුප් ගෙවීම් සඳහා හිඟුරාන සීනි කර්මාන්තායතනය වෙත ලබාදී තිබුණද, හිඟුරාන සීනි කර්මාන්තායතනයේ ගිණුම් වල වැටුප් ගෙවීම් ලෙස දක්වා තිබුණේ රු. 1,115,789 ක් පමණක් විය.

(ට) 2014 වර්ෂයේදී කන්තලේ සීනි කර්මාන්තායතනය යළි පිහිටුවීම සඳහා රු. 7,446,704 ක මුදලක් ව්‍යාපෘතියකට වැය කර තිබුණු අතර එයට උක් වගාව සඳහා රු.1,331,000 ක් ද කන්තලේ නව කාර්යාලයක් පිහිටුවීම සඳහා ඉඩම සංවර්ධනය කිරීමට රු. 1,463,153 ක මුදලක්ද ඇතුළත්වී තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය මගින් කිසිදු ප්‍රතිලාභයක් ලබා ගැනීමකින් තොරව අවසන් කර ඇති අතර උක් වගාව සම්බන්ධයෙන් ද කිසිදු පසු විපරම් කාර්යයක් සිදු කර නොතිබුණි.

(ඩ) සමාගම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර තිබුණද, සමාගම වෙනුවෙන් විශේෂ විගණනයක් කර ගැනීමට බාහිර පුද්ගලයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් වෙත රු.150,000 ක් වැය කර තිබුණි.

(න) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ වාහන හා යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා කෘෂිකාර්මික වැඩපොළක් පවත්වාගෙන ගොස් තිබුණද 2014 නොවැම්බර් සිට 2016 මාර්තු මාසය දක්වා කාලය තුළ වාහන හා යන්ත්‍රෝපකරණ 11 ක් අළුත්වැඩියාව සඳහා බාහිර ආයතන වෙත යවා තිබුණි.

(ත) බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 කට අයත් ඉඩම් හෙක්ටයාර් 791 ක් උක් වගාකිරීම සඳහා තෝරාගෙන තිබූ අතර ඉන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 6ක ඉඩම් හෙක්ටයාර් 60.6 ක් පමණක් උක් වවා තිබුණි. මින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක උක් වැවීම අසාර්ථක වී තිබූ අතර වගාකර තිබූ උක් සඳහා කුමක් සිදුවීද යන්න අනාවරණය කර නොගෙන ව්‍යාපෘතිය 2015 අගෝස්තු 28 වන දින අත්හැර දමා තිබුණි. එමනිසා මේ සඳහා දැරූ පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

## 4.2 මෙහෙයුම් දුර්වලතා

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සීනි වලට වඩා එතනෝල් මඟින් සමාගමට ලැබෙන දායකත්වය ඉහල අගයක් ගනී. එසේ වුවද, 2013,2014 හා 2015 වර්ෂයන්හිදී සමාගමේ කර්මාන්තශාලාවන්හි මුළු ධාරිතාවයෙන් භාවිතයට නොගත් ධාරිතාවය පිළිවෙලින් 1%කින් 20% කින් හා 45% කින් වැඩි වී තිබුණි. එමනිසා එතනොල් නිෂ්පාදනය හා අලෙවිය පහත වැටීම හේතුවෙන් සමාගමේ ලාභදායීත්වය පහත වැටී තිබුණි.

(ආ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදනය වූ භාවිතයට ගත නොහැකි එතනෝල් ලීටර 35,000 ක පමණ ප්‍රමාණයක් හොඳ තත්ත්වයේ පැවති එතනෝල් ගබඩා කර තිබූ ටැංකියකට (VAT2) මිශ්‍ර කිරීම හේතුවෙන් එතනෝල් ලීටර 60,618 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වීමෙන් රු. 18,185,400 ක පාඩුවක් සිදුවී තිබුණි. එම එතනෝල් ප්‍රමාණය 2015 අගෝස්තු 28 දිනට ලීටර 60,731 ක් වූ අතර එය 2015 ඔක්තෝබර් 22 වන විට ලීටර 60,618 දක්වා ලීටර 113 කින් අඩුවී තිබුණි.

(ඇ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ස්කාගාරයට කර්මාන්තශාලාවෙන් පොම්ප කරන ලද මොලෑසස් ප්‍රමාණය හා ස්කාගාරයට සත්‍ය වශයෙන් ලැබෙන මොලෑසස් ප්‍රමාණය අතර වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, මොලෑසස් මෙට්‍රික් ටොන් 751 කට අදාළව 2015 අප්‍රේල් මාසයේදී රු. 22,999,375 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ දෛනිකව නිපදවන එතනෝල් ප්‍රමාණය ඒවා ගබඩාකර ගන්නා වැට් (VAT) ටැංකි වෙත යැවීමේ දී මිණුම්කරණය කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් භාවිතා කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඉ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සීනි නිෂ්පාදන ක්‍රියාවලිය තුළදී සිදුවන සීනි කැට ගැසීම් හා වෙනත් හේතු නිසා භාවිතයට ගත නොහැකි වන සීනි ප්‍රමාණයන් කර්මාන්තශාලාව තුළ එකතු කර එය නැවත නිෂ්පාදන ක්‍රියාවලියට යොදවන නමුත් එම යෙදවුම් ප්‍රමාණයන් ලිඛිතව සටහන් කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) සෙවනගල සීනි කර්මාන්තායතනයේ ඇති නිෂ්පාදිත එතනෝල් ලීටර 143,892 ක් ධාරිතාවයක් වන වැට් (VAT) 3 ටැංකිය බාල එතනෝල් ලීටර 35,642 ක් ගබඩා කිරීම සඳහා යොදා ගැනීම හේතුවෙන් ප්‍රමිත එතනෝල් නිෂ්පාදනය ගබඩා කිරීම සඳහා යොදා ගැනීම වෙනුවෙන් භාවිතා කළ නොහැකිව නිෂ්කාර්යව තිබුණි.

(ii) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ එතනෝල්වල වර්ෂය අවසාන භෞතික තොග සත්‍යාපනයේදී ලීටර් 5715.28 ක එතනෝල් අතිරික්තයක් අනාවරණය වී තිබුණි. එතනෝල් තොග සම්බන්ධයෙන් ඒවායේ තත්ත්වය, සත්‍ය පරිමාව, එම අවස්ථාවේදී පැවති ඌනතාවය සහ සම්මත විචලනය යන කරුණු පදනම් කරගෙන නොතිබුණි. එබැවින් පවතින පද්ධති හා පාලන තත්ත්වයන් පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්වීමට නොහැකි විය.

(ඊ) විකුණුම්, අලෙවි, පරිපාලන හා කර්මාන්තශාලාවන්හි මෙහෙයුම් කටයුතු කර ගෙන යා යුතු ආකාරයන් සහ ඒවාට අදාළ පාලනයන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් ඇතුළත් කර පිළියෙල කරන ලැබූ අත්පොත් (Manuals) සමාගම සතුව නොතිබුණි.

(උ) වසර 30 ක පැරණි තත්ත්වයක පවතින දෝෂ සහිත උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර මාරු කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට ආයතනයේ කළමනාකරණය විසින් කටයුතු කර නොතිබූ අතර 2015 වර්ෂයේ යන්ත්‍රෝපකරණ බිඳ වැටීම් මත කර්මාන්තශාලාව නවතා දමා තිබූ පැය ගණන 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ වැඩිවී ඇති අතර එය මුළු කර්මාන්තශාලා පැය ගණනෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් විය.

(ඌ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදන ඒකක පිරිවැය ගණනය කිරීම සඳහා පිළිගත් පිරිවැය ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ ප්‍රධාන කාර්යාලයේ රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් සේවකයන් 6 දෙනෙකු සඳහා කළමනාකරණ ගාස්තුවක් ලෙස මාසිකව රු. 1,600,000 ක මුදලක් ගෙවා තිබියදීත්, එම සේවකයන්ට 2015 වර්ෂයේ පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගෙවා ඇති වැටුප් රු. 2,131,227 ක් විය.

(ආ) මිල තීරණ කමිටුව විසින් පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතනයන්හි නිෂ්පාදිත එතනෝල් අවම හා උපරිම විකුණුම් මිල පිළිවෙලින් රු. 290 ක් හා රු. 350 ක් ලෙස තීරණය කර තිබුණි. සමාගම තම එතනෝල් අවම මිලට වඩා අඩුවෙන් හෝ අඩු මිලට විකුණා තිබුණි. එමනිසා 2015 වර්ෂයේ සමාගමේ එතනෝල් විකුණුම් ආදායම් 2014 වර්ෂයට සාපේක්ෂව රු. 760,169,391 කින් හෝ සියයට 32 කින් අඩුවී තිබුණි.

තවද, ලීටරයක අවම විකුණුම් මිල වන රු. 290 කට එතනෝල් සියයට 90 ක් අලෙවි කර තිබුණු අතර මහා පරිමාණ මත්පැන් නිෂ්පාදකයින්ට වැඩි ලාභයක් උපයාගත හැකිවන පරිදි සමාගමේ අලෙවි ප්‍රතිපත්තිය සකස් වී තිබීමෙන් සමාගමට විශාල අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) 2014 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතන, සමාගම යටතට පවරාගෙන තිබුණද, කන්තලේ සහ හිඟුරාන සීනි කර්මාන්තායතන එසේ පවරාගෙන නොතිබුණු හෙයින් එම කර්මාන්තායතන නිෂ්කාර්ය තත්ත්වයේ පැවතුණි.

**4.4** **ආර්ථික නොවූ ගනුදෙනු**

---

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව රු. 1,371,265 ක ගාස්තුවක් ගෙවමින් ගිණුම්කරණ පැකේජයක් හඳුන්වා දී තිබුණි. කෙසේවෙතත්, මෘදුකාංගයේ මොඩියුල බොහෝමයක් සමාගම විසින් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ රු. 576,782,652 ක බැංකු අයිරාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 60,590,053 ක පොලියක් ගෙවා තිබුණි.

(ඇ) සමාගමේ අරමුණු වලට සෘජුවම සම්බන්ධ නොවන කාර්යයන් වන, කර්මාන්ත වැවිලි අමාත්‍යාංශය මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු කම්කරුවන් සඳහා ඉඩම් ඔප්පු බෙදා දීමේ උත්සවයකට අනුග්‍රාහකත්වය වශයෙන් රු. 1,000,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) සුළු පරිමාණ උක් ගොවි සීනි නිෂ්පාදන ව්‍යාපෘතිය - බදුල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.6,628,619 ක මුදලක් වැයකර තිබුණි. එසේ වුවද දරන ලද වියදම්වල නිවැරදිභාවය පිළිබඳව නිසි නිලධාරියෙකුගේ අධීක්ෂණයක් නොතිබුණි. තවද දේශපාලනඥයකුගේ විස්තර ඇතුළත් කර තිබූ හෙයින් රු. 782,843 කට ප්‍රසම්පාදනය කරන ලද ලිපි ද්‍රව්‍ය අදාළ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

(ඉ) උක් පර්යේෂණ ආයතනය විසින් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන පසුව ස්ථිර පත්වීම ලබාදී තිබූ නිලධාරියකු එම කාලය තුළම බදුල්ල දිස්ත්‍රික්කයේ උක් වගාව සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු ලෙස පත්කර මසකට රු. 100,000 බැගින් 2014 වර්ෂයේ මාස 11 ක් වෙනුවෙන් රු. 1,100,000 ක් ගෙවා තිබුණි.

**4.5** **කාර්ය මණ්ඩල පරිපාලනය**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 17 ක් වන අතර පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් සේවකයන් 8 දෙනෙකුද මෙම කාර්ය මණ්ඩලයට ඇතුළත්කර තිබුණි. ප්‍රධාන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තවද, කළමනාකරණ මට්ටමේ නිලධාරීන් වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන එම පත්වීම් වාර්ෂිකව දීර්ඝ කර තිබුණි.

(ආ) සෙවනගල සීනි කර්මාන්තායතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තවද, පැරණි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ද කර්මාන්තායතනය තුළ නොවීය.

(ඇ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය සඳහා සේවකයන් බඳවා ගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණයන් |
|---|---|---|
| | --------------- | --------------- |
| (අ) | පිරිවැය හා මූල්‍ය ගිණුම්කරණය | ක්‍රමවත් පිරිවැය හා මූල්‍ය ගිණුම්කරණ ක්‍රමවේදයක් නොතිබීම. |
| (ආ) | තොග පාලනය | යල් පැනගිය තොග හදුනාගෙන ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ තොග කපා හැරීමක් සිදුකර නොතිබුණි. |
| (ඇ) | ණය ගැති හා ණය හිමි ශේෂයන් | ණයගැති / ණයහිමි කාල විශ්ලේෂණයක් සිදුකර බොල්ණය හා අඩමාන ණය ප්‍රතිපාදන වෙන්කර නොතිබූ අතර දිගුකාලීන හිඟ ශේෂ නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | උපචිත වියදම් | දිගු කලක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | මානව සම්පත් කළමණාකරණය | අනුමත බඳවාගැනීමේ පරිපාටියක් නොතිබුණි. |
| (ඊ) | මිලදී ගැනීම් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර නොතිබුණි. |